ඇමුණුම -01

5 142


| | | | | |
|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | ) 0112669192 , 0112675011<br>) 0112698507 , 0112694033<br>) 0112675449 , 0112675280 | | මගේ අංකය<br>எனது இல<br>My No. | ) MH/AE/07/PHM/03/2020<br>)<br>) |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | ) 0112693866<br>) 0112693869<br>) 0112692913 | | ඔබේ අංකය<br>உமது இல<br>Your No. : | )<br>)<br>) |
| විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல் முகவரி<br>e-mail | ) postmaster@health.gov.lk<br>)<br>) | | දිනය<br>திகதி<br>Date | ) 2024.01.03<br>)<br>) |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>website | ) www.health.gov.lk<br>)<br>) | | | |


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක - 02-185/2023

ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
මහනුවර ජාතික රෝහලේ අධ්‍යක්ෂ,
සියලුම ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියලුම මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරිවරුන්,
ඇතුළු සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

**<u>අතුරු වෛද්‍ය සේවාවේ ශ්‍රේණිගත උසස්වීම් සලකා බලනු ලබන කාල සීමාවන් සංශෝධනය කිරීම</u>**

01. අතුරු වෛද්‍ය සේවා ගණයට අයත් තනතුරුවලට අදාල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටි සහ සෞඛ්‍ය ලේකම්ගේ අංක MH/AE05/01/2019 හා 2022.08.31 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංක 02-81/2022 අනුව අතුරු වෛද්‍ය සේවාවේ ශ්‍රේණිගත උසස්වීම් සලකා බලනු ලබන කාල සීමාවන් පහත පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/7/1/13/1/2012(Vol II) හා 2023.10.11 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඉදිරි ශ්‍රේණි උසස්වීම් සිදු කිරීමේදී පහත විධිවිධාන අදාල වේ.

01.1 බඳවා ගැනීමේ පරිපාටියේ 10.2.1.2 වගන්තිය අනුව II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

01.1.1. 2021.07.05 දින හෝ ඊට පෙර පැරණි බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති, එහෙත් එදිනට පෙර II ශ්‍රේණියට උසස් වී නොමැති නිලධාරීන් සඳහා පහත විධිවිධාන අදාල වේ.

01.1.2. පැරණි බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති දිනයේ සිට 2021.07.05 දිනය දක්වා වන සක්‍රිය හා සතුටුදායක සේවා කාලය I ශ්‍රේණියට උසස් කිරීමේ දී II ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

01.2 බඳවා ගැනීමේ පරිපාටියේ 10.3.1.2 වගන්තිය අනුව I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම

01.2.1. 2021.07.05 දිනට පෙර I ශ්‍රේණියට උසස් වී වසර 22 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් I ශ්‍රේණියේ වසර 07 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට බඳවා ගැනීමේ පරිපාටියේ පහත සඳහන් සුදුසුකම් සලකා අධි ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

i. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට සලකා බලන කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම

iii. I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

01.2.2. 2021.07.05 දිනට පෙර II ශ්‍රේණියේ වසර 07 ක් සම්පූර්ණ කර ඇති නිලධාරින් අධි ශ්‍රේණියට උසස් කිරීමේ දී I ශ්‍රේණියේ වසර 07 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිතව අතුරු වෛද්‍ය සේවයේ වසර 22 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට උක්ත 1.2.1 යටතේ සඳහන් සුදුසුකම් සලකා උසස් කරනු ලැබේ.

01.2.3. 2021.07.05 දින හෝ ඊට පෙර අධි ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවා කාලය වසර 22 ඉක්මවන අවස්ථාවක දී උපරිම වසර 03 කට යටත්ව I ශ්‍රේණියේ වසර 07 කට වඩා වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලය එම නිලධාරීන්ගේ අධි ශ්‍රේණියේ සේවා කාලයක් ලෙස සලකනු ලැබේ. කෙලෙස වූව ද මෙම විධිවිධානයන් අනුව අධි ශ්‍රේණියට උසස්වීම් ලබා දී ඇති දිනයේ වෙනසක් සිදු කරනු නොලැබේ.

02. ඒ අනුව II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට හා I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීමට අදාළව මෙහි දක්වා ඇති විධිවිධාන අනුව සුදුසුකම් ලත් නිලධාරීන්ගේ අයදුම්පත් ඇමුණුම 1 ප්‍රකාරව සකස් කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

03. එසේම මෙම ලිපියෙන් ආවරණය නොවන කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් සතු වන අතර, මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වූවහොත් එවැනි අවස්ථාවක දී සිංහල භාෂා පාඨය බලපැවැත්වෙන්නේය.

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්

වෛද්‍ය පී.ජී.මහීපාල,
ලේකම්.

පිටපත් -

i. සියලුම පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභා ලේකම්වරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
ii. සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
iii. සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
iv. සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා